# පානදුර බාලිකා මහා විද්‍යාලය - කළුතර

## වාර අවසාන පරීක්ෂණය 2018 නොවැම්බර්

## 13 ශ්‍රේණිය

## ඉන්දියා ඉතිහාසය

25A-S-2

සැලකිය යුතුයි.
පළමුවන ප්‍රශ්නය (A කොටස) අනිවාර්ය වේ.
B හා C කොටස් වලින් එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න එක බැගින් තෝරාගෙන ප්‍රශ්න තුනකට ද පිළිතුරු සපයන්න.
පළමුවන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා ඉන්දියාවේ දළ සිතියමක් සපයා ඇත.

### A කොටස

01. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.

| | | |
|---|---|---|
| 01 තප්ති නදිය | 05 රූපාර් | 09 අයිහෝලේ |
| 02 චම්බාල් නදිය | 06 චන්හුදාරෝ | 10 ඉන්ද්‍රප්‍රස්ථ |
| 03 කොචින් | 07 අරවල්ලි | 11 ධෞලී |
| 04 කාවේරි පටුන | 08 කාඩමන් | 12 ගිර්නාර් |

(ලකුණු 12)

### B කොටස

02. හරප්පා සභ්‍යත්වයේ වැසියන් ඉහළ සාමාජික තත්ත්වයක් හිමිකරගෙන සිටි බව පහත තේමා මුල්කරගනිමින් විස්තර කරන්න.
01 සෞඛ්‍යය හා සනීපාරක්ෂාව 02 නිවාස 03 ඇඳුම් පැළඳුම් 04 විනෝදාස්වාදය හා ක්‍රීඩා (ලකුණු 16)

03. පහත මාතෘකා ඔස්සේ ඉන්දුනිම්න වැසියන්ගේ වාස්තු විද්‍යාත්මක ඉදිකිරීම් පිළිබඳ විස්තරයක් කරන්න.
01 නිවාස 02 පොදු ගොඩනැගිලි (ලකුණු 16)

04. ඍග් වෛදික යුගයේ ආර්ථික හා දේශපාලන තත්ත්වය පශ්චාත් වෛදික යුගයේ දී වෙනස් වූ ආකාරය විස්තර කරන්න.
(ලකුණු 16)

05. ආර්යයන් සප්ත සින්ධු ප්‍රදේශයේ සිට ගංගා නිම්නයට සංක්‍රමණය වීම අතර කාලයේ දක්නට ලැබෙන්නේ පශ්චාත් වෛදික සීමා බිඳලමින් මහා ජනපද බිහිකරන්නට අවශ්‍ය පදනම සැකසෙන අයුරු ය. පහදන්න.
(ලකුණු 16)

### C කොටස

06. පීතෘ ඝාතකයෙකු ලෙස ඇතැම් මූලාශ්‍රය වල හඳුන්වා දී තිබුණ ද මගධයේ වර්ධනයට අජාසත් රජු දැවැන්ත මෙහෙවරක් සිදුකර තිබේ. පහදන්න. (ලකුණු 16)

07. අශෝක අධිරාජයා අශෝක දහම තුළින් සිය පාලන කටයුතු ස්ථාවර කරගැනීමටත් රාජ්‍ය අභ්‍යන්තර තත්ත්වය සාමකාමීව පවත්වාගැනීමටත් සමත් විය. මෙම කරුණ පිළිබඳ විශේෂ අවධානය යොමු කරමින්
01 අශෝක දහම පිළිබඳ විස්තරයක් කරන්න. **නැතහොත්**
02 අශෝක රජුගේ දේශපාලන කටයුතු පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 16)

08. මගධයේ මෞර්ය බලය පිරිහීමට පසු ගුප්ත අධිරාජ්‍යයේ පිබිදීම දක්වා යුගය දේශපාලනික වියවුල් යුගයකි. එම යුගය පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 16)

09. දෙවන චන්ද්‍රගුප්ත අධිරාජයා ගුප්ත අධිරාජ්‍යයේ බලය වර්ධනය කිරීම කෙරෙහි පහත ක්‍රම යටතේ කටයුතු ඇති ආකාරය විස්තර කරන්න. (ලකුණු 16)
01 යුධමය ක්‍රියාමාර්ග
02 විවාහ සබඳතා

පානදුර බාලිකා මහා විද්‍යාලය - කළුතර

වාර අවසාන පරීක්ෂණය 2018 නොවැම්බර්

13 ශ්‍රේණිය

ඉන්දියා ඉතිහාසය

25A-S-2

